# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/18 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබලිව. 68(70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

විලියම් ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපතිවරයාගේ කාර්යාලයේ දී ය.

නියෝග

1. මේ නියෝග හදිසි අවස්ථා (බලකර ලබා ගත් දේපළ හෝ ව්‍යාවසායන් සඳහා වන්දි මුදල් ගෙවීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග ක්‍රියාත්මක වීමට පෙර හෝ පසු යම් අවස්ථාවක යම් හදිසි අවස්ථා නියෝගයක් අනුව හෝ හදිසි අවස්ථා නියෝගයක් අනුවයි සලකා යම් දේපළක් හෝ ව්‍යවසායක් බලකර ලබා ගන්නා ලද හෝ බලකර ලබාගනු ලබන අවස්ථාවක, එම බලකර ලබා ගැනීම මගින් ආවේදිත යම් තැනැත්තකු විසින් අමාත්‍යවරයා වෙත, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන කාලයක් තුළ, වන්දි සඳහා තම හිමිකම් පෑම් දක්වෙන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කළ හැකිය.

3. ගෙවිය යුතු වන්දිය තීරණය කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන සියලු පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීමට සැලැස්වීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

4. වන්දි තීරණය කිරීම සඳහා සංකීර්ණ යයි හෝ දුෂ්කර යයි හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන යම් කරුණක් ඔහු විසින් පත් කරනු ලබන, සාමාජිකයින් තුන් දෙනෙකුට නොඅඩු ගණනකින් සමන්විත වන මණ්ඩලයක් වෙත ඔහු විසින් යොමු කළ හැකිය.

5. මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් කෙනෙකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපති ලෙස පත් කරනු ලැබිය හැකිය.

6. මණ්ඩලය වෙත යොමු කරන ලද යම් කරුණක් සලකා බැලීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන සියලු පරීක්ෂණ පැවැත්වීමේ සහ සියලු සාක්ෂි විභාග කිරීමේ බලය මණ්ඩලයට තිබෙන්නේය.

7. මණ්ඩලය වෙත යොමු කරන ලද යම් කරුණක් සලකා බැලීමෙන් පසුව, මණ්ඩලය විසින් තම මතය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

8. වන්දි සඳහා වූ යම් හිමිකම් පෑමකට ප්‍රමාණවත් සාධක ඇතැයි අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, මහාජන ආරක්ෂාව සහ මහාජන සාමය පවත්වා ගැනීම සහ හමුදා කැරැල්ලක්, කැරලි කෝලාහලයක් හෝ මහාජන කැළඹීමක් මැඩ පැවැත්වීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි ඔහුට පෙනී යන සලකා බැලීම්වලට යටත්ව, වන්දි හිමිකම් පා ඇත්තේ යම් බලකර ලබා ගැනීමක් සම්බන්ධයෙන් ද ඒ බලකර ලබා ගැනීමේ හේතුවෙන් හිමිකම් පාන්නාට සිදු වී ඇති අලාභය හෝ හානිය හැකිතාක් දුරට පියවිය යුතුය.

35A——ඒ 24309—2,100 (76/12)

9. බලකර ලබා ගත් දේපළ හෝ ව්‍යවසාය සම්බන්ධයෙන් පාරිශ්‍රමික, බදු, තීරුබදු හෝ වෙනත් ණයතුරුස් වශයෙන් ආණ්ඩුව විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු සියලු මුදල් සහ එම දේපළ හෝ ව්‍යවසාය නඩත්තු කිරීමේ දී දරන ලද වෙනත් වැඩිදුර වියදම්, ගෙවිය යුතු වන්දි මුදලෙන් අඩු කර ගත යුතුය.

10. යම් බලකර ලබාගත් දේපළක් හෝ ව්‍යවසායක් සම්බන්ධයෙන් වන්දි මුදල් ගෙවීමට අමාත්‍යවරයා තීරණය කරනු ලබන අවස්ථාවක, එම බලකර ලබා ගැනීමට අදාළ විස්තර, හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය සහ වන්දි මුදල් වශයෙන් ගෙවිය යුතු මුදල නිශ්චය කරමින් ඔහු විසින් නියමයක් කළ යුතුය.

11. යම් හදිසි අවස්ථා නියෝගයක් අනුව හෝ යම් හදිසි අවස්ථා නියෝගයක් අනුවයි සලකා යම් දේපළක් හෝ ව්‍යවසායක් බලකර ලබා ගැනීම සම්බන්ධයෙන් මේ නියෝගවල විධිවිධාන සලසා ඇති ආකාරයට හැර වන්දි හෝ අලාභ සඳහා කිසිම තැනැත්තකුට ශ්‍රී ලංකා ජනරජයට විරුද්ධව යම් අයිතිවාසිකමක් නොතිබිය යුතු අතර, තීරණයට භාජනව ඇති හෝ නැති එම දේපළ හෝ ව්‍යවසාය සම්බන්ධයෙන් වන යම් හිමිකම් පෑමක් ඇතුලු යම් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කරුණක් ඒ අනුව තීරණය කළ යුතුය.

12. වෙන යම් හදිසි අවස්ථා නියෝගයකින් වන්දි ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වෙන්නා වූ හෝ යම් දේපළක් බලකර ලබා ගැනීමට සහ ඒ දේපළ බලකර ලබා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි තමාට පෙනීයන විධාන කිරීමට යම් බලධරයකුට බලය පැවරෙන්නා වූ අවස්ථාවක මේ නියෝගවල විධිවිධාන බල නොපවත්වන්නේය.

13. මේ නියෝගවල—

"හදිසි අවස්ථා නියෝග" යන්නෙන් මහාජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද යම් නියෝගයක් අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් මුදල් අමාත්‍යවරයා හෝ මේ නියෝගවල කාර්යය සඳහා මුදල් අමාත්‍යවරයා විසින් නම් කරන ලද වෙනත් යම් අමාත්‍යවරයකු අදහස් වේ ;

"යම් බලකර ලබා ගැනීමකින් ආවේදිත තැනැත්තා" යන්නෙන් බලකර ලබාගත් දේපළ හෝ ව්‍යවසාය කෙරෙහි තමාටම පමණක් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් භාරයක් ලෙස හෝ පුණ්‍ය, ආගමික හෝ වෙනත් කාර්යයන් සඳහා හිමිකම් අයිතිය තිබෙන තැනැත්තෙක් අදහස් වේ ;

"ව්‍යවසාය" යන්නට දැනට පවත්වා ගෙන යන්නක් වුව ද නොවුව ද යම් වෙළඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී